දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය -2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

සිංප්‍ර 1.2 - සාහිත්‍ය පරිචය
SL 1.2 – Competence of Literature

කාලය පැය (03) තුන යි.

පළමු ප්‍රශ්නය අනිවාර්යයි. නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.
පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. (අ) සහ (ආ) කොටස්වල තද කළු අකුරින් මුද්‍රිත පද සියල්ලෙහි ම අරුත් සහිත ව ඒවා වත්මන් ලිඛිත සිංහලයට නගන්න.

(අ)

"...සේනකයන් විසින් කියන ලද දැන් මේ වූ කාරණය අසා රජ්ජුරුවෝ, සේනකයන් විසින් ගෙන හැර දක්වන ලද්දා වූ මේ කාරණය ඉතා ම යහපත; මපුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ මේ සේනකයා ගේ වාදය බිඳ අනෙක් කාරණයක් ගෙන හැර දක්වන්නට පෝසත්හු දෝ හෝ යි සිතා, "කිමෙක් ද, පණ්ඩිතයෙනි" යි කීහ. සේනකයා තමන් විසින් මේ කාරණය ගෙන හැර දැක්වූ කළ දැන් වනාහි මහ බෝසතාණන් වහන්සේ විනා අනෙක් ඒ වාදය බිඳින්නට සමර්ථ කෙනෙක් මුළු දඹදිවැ නැත්තාහ. එසේ හෙයින් බෝධිසත්වයන් වහන්සේ තමන් වහන්සේ ගේ <u>**විදුරක්**</u> හා සමාන අසාධාරණ වූ ප්‍රඥානුභාවයෙන් ඒ සේනක පණ්ඩිතයන් ගේ වාදය බිඳිනා සේක්, "දේවයන් වහන්ස, මේ නුවණ නැති සේනකයා කුමක් දනී ද? මේ ලොවැ විඳ ගන්නා යසස් බලයි; නුවණෙහි අරුම නොදන්නේ ය. නුවණෙහි අරුම ඇසුව මැනැව, දේවයන් වහන්සැ" යි කියා ගාථාවෙකින් කාරණය දක්වන සේක්, "නුවණ ඇත්තන් විසින් ම පැසිඳිය යුතු වූ එබඳු කටයුත්තක් උපන් කල්හි, නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ නුවණ ඇත්තහු ගේ ගැත්තකු මෙන් පවත්නේ ය. නුවණැත්තේ ප්‍රඥායෙන් කටයුතු සියුම් වූ යුක්ති ආදි යම් ගැටමුසු කාරණයක් සැක හැර කියා ද, එ බඳු කාරණයෙහි නුවණ නැත්තේ <u>**අවලෝකනය කොට ගත නො හී**</u>, ඒක්ෂණයෙහි <u>**කණගෙරි**</u> වල් වන්නා සේ මුළා බවට පැමිණෙන්නේ ය. මේ කාරණය දැක, නුවණැත්තෝ ම උතුමැ, නුවණ නැත්තෝ උතුම් නොවෙති' කියමි" යි කී හ. මෙර ගල් මුදුනෙහි සත් රුවන් ගෙන හැර පා වගුරුවන්නක්හු මෙන් ද, ආකාශයෙහි පුන් සඳ ඔසවා පාන්නක්හු මෙන් ද උත්තර ගෙන හැර දැක්වූ සේක."

(උම්මග්ග ජාතකය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2002.)

(ලකුණු 07)

(ආ)

| | |
|---|---|
| සකත අයුරු පැරකුම් නිරිඳුගෙ | පවර |
| සමත විපුල් බල සිවුරඟ සෙන් ළ | තර |
| දිගත පැමිණ කො ද නොපහළ රුපු | නුවර |
| යුගත සයුරු රළ නොපහළ තැන් | කවර |

(ලකුණු 07)

| | |
|---|---|
| රඳා මුහුදැ රන් මිණ කිරණින් | වෙසෙස |
| උදා දිනිඳු රතු කැරැ සිය රස් | සහස |
| උදා සිරසැ වැනුවා මෙන් ඉඳුරු | දෙස |
| එදා අරුණු දිසි සඳ නො ගොසින් මැ | බැස |

(ලකුණු 07)

(ගිරා සන්දේශ විවරණය. කුමාරතුංග මුනිදාස සංස්කරණය, 2002.)

(ඇ)

පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි ධ්වනිතාර්ථවත් අදහස කෙටියෙන් පැහැදිලි කොට, කවියා ඒ සඳහා භාවිත කළ කාව්‍යාලංකාර නිදසුන් සහිත ව විවරණය කරන්න.

**මද්‍රි දේවි හෙවත් ගමෙන් උපන් නිළිය**

සල් ගහ බලන් මල්වර වී අවාරෙට
සිහිනය සැබෑ වූයේ පෙර කළ පිනට
සිත්තරු සිටිති මා රුව අඳිනට රුවට
මලකින් උපන්නෙම් දැයි දැන් සිතෙයි මට

වෙසක් තොරණ යට සැදූ රඟ මඩල
පුන්සඳ නැවති බැලුවේ මා මුව කමල
වෙස්සන්තරත් මා වැනි අඹුවක නො රැක
දන් දුන්නේ මා අඩවා පෝ දාක

නිළියක ලෙසින් මා ගම හැර ගිය එදින
ඇඹුවලු සොවින් ගහ අසබඩ වස්දඹුව
සඳ කිඳුරුව රඟ දක්වන මතු දිනක
සිඹ සිඹ අඩමි ඔබගේ රන්වන් සිරුර

අමල් බිසෝ දොර ඇරියේ විනාසෙට
මා නම් මෙසේ දිවි පිදුවේ කලාවට
වැව් පිටිවල තැන් තැන්වල රැඟූ මට
නිළියක ලෙසින් මිය ඇදුණත් කමක් නැත

පුවත්පතක, ඇන්විමක, තාප්පෙක
මගේ මුහුණ වෙන්දේසිය දකින සඳ
නුඹට ගෙවන්නට බැරි තරමේ මිලට
මා විකිණුනු බව සිහි කරලනු මැනව!

(ලකුණු 07)

02. "පාලන තන්ත්‍රයේ යථා ස්වභාවය උම්මග්ග ජාතකයෙන් හුවා දැක්වෙයි." කතා පුවතේ අන්තර්ගත චරිත නිරූපණය, අවස්ථා හා සිද්ධි නිරූපණය අනුසාරයෙන් මේ අදහස සාකච්ඡා කරන්න.

(ලකුණු 18)

03. ''අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව හෙවත් ප්‍රතිභාවේ ප්‍රධානතම ලක්ෂණය වන්නේ පරිකල්පනය යි.'' මේ ප්‍රකාශය ගිරා සංදේශය ආශ්‍රයයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 18)

04. **යසෝදරාවතෙහි** කාව්‍යානුභූතිය මනා ශබ්දාර්ථ සුසංයෝගයකින් ඉදිරිපත් කිරීමට කවියා සමත් වී ඇති ආකාරය සනිදර්ශන ව පෙන්වා දෙන්න.

(ලකුණු 18)

05. ''ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත.'' මනමේ නාට්‍යය ඇසුරෙන් නිදසුන් සහිත ව මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 18)

06. පුද්ගලයන්ගේ ව්‍යාජ විඥානය ඔස්සේ මතු කෙරෙන සංකීර්ණ ගති ලක්ෂණවල යථා ස්වභාවය, **ප්‍රේමයේ සත්‍ය කතාව** නවකතාවෙහි නිරූපණය වන නිමල්, උපාලි සහ ඉන්දිරා යන චරිත ඇසුරෙන් නිදර්ශනාත්මක ව විමසන්න.

(ලකුණු 18)

(02 සිට 06 දක්වා ලකුණු 18 බැගිනි.)

********************